ලක් මැදුර පදනමින් ඕස්ට්‍රේලියාවටම

කෑම ලෑස්තියි

අජිත් මෙන්ඩිස් ගේ "කෑම ලෑස්තියි" සමගින්
ශ්‍රියන්ත වසන්ත ජනක මාධිනී
නැවතත් ඔබ හමුවට

2014

ජූලි 19 මෙල්බර්න්
ජූලි 26 පර්ත්
අගෝස්තු 2 සිඩ්නි
අගෝස්තු 9 බ්‍රිස්බේන්
අගෝස්තු 16 ඇඩිලේඩ්

අජිත් මෙන්ඩිස්

1976 සේනක පෙරේරාගේ 'ඉල්ලිස' වේදිකා නාට්‍යයේ රඟපාමින් වේදිකාවට අවතීර්ණ විය. හැත්තෑව දශකයේ අවසාන කාලයේ කෙටි නාට්‍ය ප්‍රබෝධයත් සමග කෙටි නාට්‍ය නිෂ්පාදනයට සම්බන්ධවෙමින්, 1978 'දඹරත්', 'දූතමෙහෙවර' කෙටි නාට්‍යයන් දීපව්‍යාප්ත උළෙල අවසාන වටය නියෝජනය කළේය. 1979 'අහස් ගව්වෙන් වැටුන එකෙක්' කෙටි නාට්‍ය හොඳම නිෂ්පාදනය, හොඳම රචනය ඇතුළු ප්‍රධාන සම්මාන 7 ක් දිනාගත්තේය. එම වසරේදීම 'වතන්තරේ පුංචි ගෙදර' ළමා නාට්‍ය නිෂ්පාදනය කරන ලදී.

1980 ගම්පහ දිස්ත්‍රික් රාජ්‍ය නාට්‍ය උළෙල වෙනුවෙන් නිෂ්පාදනය කළ 'දේශසීමා' නාට්‍ය හොඳම නිෂ්පාදනය දෙවන ස්ථානය හොඳම රචනය දෙවන ස්ථානය දිනාගත්තේ එහි පළමු ස්ථානය දිනූ ජැක්සන් ඇන්තනිට දෙවැනිවෙමිනි. එහි රඟපෑ ජයන්ත චන්ද්‍රසිරි සිය දිවියේ ප්‍රථම සම්මානය දිනාගනිමින් දක්ෂතම සහය නළුවා විය. 1983 දී ජාතික තරුණ සේවා සභා නාට්‍ය උළෙල වෙනුවෙන් නිෂ්පාදනය කළ 'දෙයියන්ගේ පුංචි අක්කරය' නාට්‍යය එම වසරේ හොඳම නිෂ්පාදනය ඇතුළු සම්මාන 6 ක් දිනාගත්තේය. එහි ශ්‍රියන්ත මෙන්ඩිස්, මහේන්ද්‍ර පෙරේරා, කුසුම් රේනු ප්‍රධාන චරිත රඟපෑහ.

1984 දී පාස්කු උත්සවය වෙනුවෙන්, 'ප්‍රදාස්ගේ රාත්‍රිය' නිෂ්පාදනය කළේය. එහිදී ශ්‍රියන්ත මෙන්ඩිස්, ජැක්සන් ඇන්තනි, ජයන්ත චන්ද්‍රසිරි සහ ස්වර්ණා බෝධිපක්ෂ ප්‍රධාන රඟපෑහ. 1988 දී මා සොයුරු ශ්‍රියන්ත මෙන්ඩිස් වෙනුවෙන් 'පැංසු දෙකේ හංසයා' ද, 2000 දී ඔහු වෙනුවෙන්ම 'පාදඩ අසපුව' ද, 2011 දී ඔහු වෙනුවෙන්, ඉතාලි ජාතික දාරියෝ පෝගේ නාට්‍යයක් අනුසාරයෙන් ඩබ්. එස්. විජේසිංහ මහතා විසින් සිංහලට නැගූ කෙටි නාට්‍ය පෙළෙහි අනුවර්ථනයක් ලෙස 'ගැබ්බර මිනිසා' රචනා කරන ලදී. එය මේ දිනවල දිවයින පුරා සාර්ථකව ප්‍රදර්ශනය කෙරෙයි. එසේම සරත් කුලාංග නිෂ්පාදනය කළ දේශීය නර්ථන සහ ගීත ඇතුළත් 'දෙයියොත් දන්නෙ නැහැ' වේදිකා නාට්‍ය ඔහුගේ නවතම නාට්‍ය රචනයයි. එසේම රොඩිනි වර්ණකුල වෙනුවෙන් 'චීන වෙළෙන්දා' නමින් ප්‍රහසන නාට්‍යයක් රචනා කොට ඇති අතර එය හුදුරු දිනෙක වේදිකා ගතවීමට නියමිතය. ඔහු විසින් නිෂ්පාදනය කරන ලද නවතම වේදිකා නාට්‍ය වන ''කෑම ලෑස්තියි'' මේ දිනවල සාර්ථකව වේදිකාගතවේ.

එසේම රොඩිනි වර්ණකුල සමග එක්ව 'සාරංගා නැවෙන් ඇවිත්' නාට්‍ය රචනා කළ අතර, ශ්‍රීනාත් මද්දුමගේ සඳහා 'මපටි ෂෝ' ළමා නාට්‍ය රචනා කරන ලදී. බම්බලපිටිය ශුද්ධවු පවුලේ කනගාරාමය වෙනුවෙන් 'දහම්තුරක වත' සහ 'සාමය ලස්සන කථාවකි' ළමා නාට්‍ය රචනා කරන ලදී.

1989 දී ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණය වෙමින් රූපවාහිනිය වෙනුවෙන් රොහාන් වැලිවිට අධ්‍යක්ෂණය කළ 'නත්තල් සීයා ඇවිත් ගියා' ඒකාංගික නත්තල් නාට්‍ය ද, ස්වාධීන රූපවාහිනි සේවය වෙනුවෙන්, ලිලන්ත කුමාරසිරි අධ්‍යක්ෂණය කළ ඒකාංගික නත්තල් නාට්‍යයන් වන 'සඳගිර පාමුල', 'ධවල දඩබිම', 'පැරිසියේ කුමරිය' සහ රූපවාහිනිය වෙනුවෙන් තිරාජ් ලෙස්ටර් අධ්‍යක්ෂණය 'සහශ්‍ර සුවර්ග ද්වාරය', 'ගිම කැට හීන' ද රචනා කරන ලදී. එසේම ස්වාධීන රූපවාහිනිය වෙනුවෙන් 'කෝපිකඩේ' කොටස් කිහිපයක්ද, 'අන්දර වැට' කොටස් විස්සක් පමණද රචනා කරන ලදී.

මාලා ටෙලි නාට්‍යට තිරරචනයට සම්බන්ධ වෙමින් ලිලන්ත කුමාරසිරි අධ්‍යක්ෂණය කළ කොටස් 24 කින් යුත් 'කේතුමති නෑයෝ' තිරනාටකය, මේ වන විට නිෂ්පාදනයේ පවතින දේවින්ද කෝන්ගහගේ අධ්‍යක්ෂණය කරන 'භව සිද්ධාන්ත' ටෙලි නාට්‍යය, සහ මංජුල කරුණාරත්න අධ්‍යක්ෂණය කළ 'පබළු පාලම' ටෙලි වෘතාන්තයද රචනා කළ අතර, බර්ට්‍රම් තිහාල් සමග එක්ව 'අමරපුරය' ටෙලි පිටපත රචනා කරන ලදී. මේ දිනවල ස්වාධීන රූපවාහිනියේ විකාශය වන 'සිගිත සින්ඩරෙල්ලා' මාලා නාටකය මෙන්ම ජාතික රූපවාහිනියේ 'මුල්' නමැති ජාතික චරිත හඳුන්වාදීමේ ටෙලි වැඩසටහන රචනා කරයි. එසේම දේවින්ද කෝන්ගහගේ අධ්‍යක්ෂණය කරන 'භව තරණ' සහ ෂාන් කරන්නාගොඩ අධ්‍යක්ෂණය කරන 'කැකුලි' ළමා චිත්‍රපටයයේ තිරපිටපත් රචනා කරන ලදී.

ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ලේඛකත්ව සහ ජන සංනිවේදන ඩිප්ලෝමාද, ග්‍රැෆික් නිර්මාණය වෙනුවෙන් සහ මුද්‍රණ සැලසුම් වෙනුවෙන් ශ්‍රී ලංකා මුද්‍රණ පාසැලෙන් රන් පදක්කම් දෙකක්ද දිනා ඇත.

අජිත් මෙන්ඩිස් සමග සන්නස කළ කතා බහක්

අජිත්... 1983 දෙයියන්ගේ පුංචි අක්කරය නිෂ්පාදනයෙන් වසර තිහකට පසුවයි ඔබ වේදිකා නාට්‍යයක් නිෂ්පාදනය කරන්නේ ?

වෘත්තීය ජීවිතයන් එක්ක විශාල වශයෙන් නිර්මාණ කාර්යයේ යෙදෙන්න කාලයක් තිබුනෙ නෑ... ඒත් හැමදාම මමත් වැඩක් කරන්න ඕනෙ කියල හිතේ තිබුනා, අහසයන්ට පිටපත් ලිව්ව ඇති කියලත් හිතුනා. ඒ අතරතුරේ නිර්මාණයක් කරන්න

කාලයකුත් ලැබුනා... මේ දේවල් වල ප්‍රතිඵලයක් ලෙසයි කෑම ලෑස්තියි නිර්මාණය එලිදැස්වුනේ

කෑම ලෑස්තියි ගැන කතාකරමුද ?

මතුපිටින් බලපුවාම බොහොම සරල නමක් වාගේ පෙනුනට කෑම ලෑස්තියි තුළින් අපි කථාකරන්නෙ අපේ රටේ දේශපාලනයේ එක් පැතිකඩක්... සමාජ ව්‍යසනයක් බවට පත්වෙමින් පවතින මගේ රටේ දේශපාලන ක්‍රියාකාරිත්වය දෙස සෝපහාසයෙන් බැලීමට ගත් උත්සාහයක් තමා කෑම ලෑස්තියි

කෑම ලෑස්තියි කියන්නෙ දැන් කාලෙ රැල්ලට නිපදවෙන සරළ හාස්‍ය නාට්‍ය වාගේ සරල ප්‍රහසනයක් නෙවෙයිද ?

පැහැදිලිවම මෙය ප්‍රහසනයක්. එහෙත් මේක සරල ප්‍රහසනයකට ලඝු කරන්න මට වුවමනා වුනේ නෑ... මෙම සමාජ බේදවාචකය තුළ තිබුන ගැඹුර ප්‍රහසනාත්මක රීතියකින් කථාකරන්නයි උත්සාහ කළේ. අපි නාට්‍යයට භාවිතා කළේ බුදින්නට නොව විඳින්නට කියන උධෘතය. අද වනවිට මගේ රටේ සියලු සාමාජ සාරධර්ම, පුරුෂාර්ථ, සංස්කෘතිය, සදාචාරය පමණක් නොව මනස්සකම පවා මේසයක තබා බුදින්නට අපේ දේශපාලකයින් පසුබට නොවන වකවානුවක අපි දිවි ගෙවන්නෙ. මෙම බේදවාචකය ප්‍රේක්ෂකයාට දැනෙන ආකාරයට, විඳින්නට හැකි ආකාරයට ඉදිරිපත් කිරීමයි වැදගත් වුනේ.

මෙම නාට්‍යය මුල සිට අගට සැහැල්ලුවෙන් රස විඳීමට හැකියි. එහි මතුපිට තලයේ සරල බව ඉතා මැනවින් සටහන් වෙනවා. එහෙත් යටි තලයේ ගැඹුර අර්ථය මතුකරනවා. ඒ නිසා කෑම ලෑස්තියි යනු අවරගනයේ ප්‍රහසන නාට්‍යයක් නොවේ. සමාජ යථාර්තය නුවාදැක්වෙන සමාජ වටිනාකමක් සහිත ප්‍රහසන නාට්‍යයක් ලෙස හඳුන්වන්න කැමතියි.

මේ තුළ ඉතිහාසයේ යම් භාවිතාවක් සටහන් වෙනවා. එහෙමද ?

ඉතිහාසය කියන්නෙ අතීතය. අතීතයෙන් පරිබාහිර වුන අනාගතයක් ඇතැයි මා සිතන්නෙ නෑ. විශිෂ්ඨ ඉතිහාසයක් තිබූ රටකට ජාතියකට තමන්ගේ ඉතිහාසය පසෙක දමන්න කිසිදු වුවමනාවක් ඇතැයි සිතෙන්නෙත් නෑ. එසේම ඉතිහාසය තුළ කැටිවුන හැඳියාව, සාරධර්ම සහිත සමාජයට මෑතක් වනතුරුම අපිට තිබුනා. ඒ සමාජයේ බිඳවැටීම පටන්ගත්තෙ වණික් ආර්ථිකයේ යුග පෙරළියත් සමගයි. අපි දැන් මේ පසු කරන්නෙ ඒ සංක්‍රාන්ති කාලයයි. මේ සියලු යථාර්ථයන් රළු පරළු ආඛ්‍යානයකින් කථාකළා නම් ප්‍රේක්ෂකාගාරයට සහාදයින් කැඳවාගැනීම දුෂ්කරයි. සියල්ල සරල සහ සුගම කළේ ඒ නිසයි.

වර්තමාන වේදිකාවේ තිබෙන දේශපාලන ප්‍රහසන රැල්ල නිසාද ඔබත් කෑම ලෑස්තියි කියන දේශපාලන ප්‍රහසනය නිර්මාණය කළේ?

ඔබ කියන නාට්‍ය තුළ විශේෂත්වය තමා එදිනෙදා වෙනස්වන දේශපාලන සිද්ධීන්, වෙනස් වන ආකාරයට එකතුකරගෙන පවත්වාගෙන යාම. මේවා දේශපාලනයේ උඩුතලයේ තිබෙන සිදුවීම්, ඒවා බොහොම සරලව ගෙන ඒවාට සිනාසෙනවා. ප්‍රහසන නාට්‍යයක් වුවත් 'කෑම ලෑස්තියි' එතරම් ලඝුකොට නොගන්නා ලෙස මම නැවතත් ඔබට කියනවා. මෙය දේශපාලනීයකරණය වූ සමාජ බේදවාචකය පිළිබඳව යටි තලය දක්වා කථාකරන නාට්‍යයක්. ඉතිහාසයේ විටෙන් විට මතුවන රැවටීම් සහ රැවටිලිකාරයින් ගැන තිවැරදි කථිකාවත් තමා මෙහි අන්තර්ගතය.



කෑම ලෑස්තියි වෙත ලැබෙන ප්‍රතිචාර කොහොමද?

අපි ප්‍රථම වතාවට මෙහි මංගල දර්ශනය පැවැත්වූයේ මාතර. එය ඇත්ත වශයෙන්ම සුවිශේෂ ආරම්භයක් වුනා. අපිට මේ වන විට ලංකාව පුරා බොහෝ නගරවල දර්ශන වාර රැසක් පැවැත්වීමට හැකිවුනා. කොළඹදී වගේම ගමේදී අපිට ලැබුන ප්‍රතිචාර අතිශයයි. සරලව සිතන අය සරලවත්, ගැඹුරින් සිතන අය ගැඹුරිනුත් මෙය ග්‍රහණය කරගත්තා. එය අපට දිරියක්.

කෑම ලෑස්තියි කණ්ඩායම මතක් කළොත්

ශ්‍රියන්ත මෙන්ඩිස්, මාධනි මල්වත්තගේ, ජනක කුමුදුකගේ, වසන්ත විරිටවිව්, කීර්ති කේ රත්නායක, ප්‍රදීප් ඇරදීගම, සමන්ත පරණලියනගේ රංගනයෙන් දායක වෙනවා. සංගීතය සරත් කුලාංගගෙන්, ඇංග රචනය වසන්ත විරිටවිව් සිදුකරනවා. රංගවස්ත්‍ර කමල්කාන්ති බෝගොඩ. රංග භාණ්ඩ චාමර අනුදත් රාජපක්ෂ. මෙහි ඉදිරිපත් කිරීම ජූඩ් ශ්‍රීමාල්.